# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.12.26 පැය 1915 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/2903/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පුපුරණ ද්‍රව්‍ය ඇති බවට ලද තොරතුරක් මත සෝදිසි මෙහෙයුමක් ක්‍රියාත්මක කිරීම.**

මහනුවර දිස්ත්‍රික් ලේකම් තුමන්ගේ නිල කාර්යාල ඊ මේල් ලිපිනයට (26) වන අද දින ඊ මේල් පණිවිඩයක් මගින් මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ස්ථාන 05 ක බෝම්බ සඟවා ඇති බවට ලද පනිවිඩයක් සම්බන්ධයෙන් මහනුවර කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී වරයාට කරන ලද දැනුම් දීමක් මත මහනුවර පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මේ සම්බන්ධයෙන් විමර්ශනයක් ආරම්භ කර ඇත.

ඒ අනුව මේ සම්බන්ධව සෝදිසි මෙහෙයුමක් ක්‍රියාත්මක අතර ඒ සඳහා පොලිස් නිල සුනඛ කොට්ඨාසය, පොලිස් විශේෂ කාර්ය බලකා බෝම්බ නිෂ්ක්‍රීය අංශය හා යුද හමුදා බෝම්බ නිෂ්ක්‍රීය අංශයද කැඳවා ඇත. මෙතෙක් සිදු කරන ලද සෝදිසි මෙහෙයුම් වලදී කිසිදු පුපුරණ ද්‍රව්‍යක් හමු වී නොමැත.

මෙම සෝදිසි මෙහෙයුම් කටයුතු තවදුරටත් ක්‍රියාත්මකව පවතී.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**